කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 01 WW/TC/21/05/12/01
වර්ණය : ඇම්බර්

# ගිනිකොණ දිග අරාබි මුහුද ආශ්‍රිතව වර්ධනය වන අඩු පීඩන තත්ත්වය පිළිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් 2021 මැයි මස 12 වන දින ප.ව. 1.00 ට නිකුත් කරන ලදී.

## ගිනිකොණ දිග අරාබි මුහුදු ප්‍රදේශය සහ ශ්‍රී ලංකාවට බටහිර දිශාවෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ සඳහා

## සැලකිලිමත් වන්න!

- ගිනිකොණ දිග අරාබි මුහුදු ප්‍රදේශයේ, මැයි මස 14 දින වන විට අඩු පීඩන තත්ත්වයක් වර්ධනය වීමේ හැකියාව පවතී. ඉන් පසුව, මෙම පද්ධතිය ක්‍රමයෙන් වයඹ දෙසට ගමන් කරමින් සුළි කුණාටුවක් දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- එබැවින්, ඉදිරි දින කිහිපයේ දී, ගිනිකොණ දිග අරාබි මුහුදු ප්‍රදේශය (00-12N, 60E-75E) හරහා ගිගුරුම් සහිත වැසි සමග විටින් විට වැඩිවන තද සුළං ( පැ.කි.මී. 50-60 සහ විටින් විට පැ.කි.මී. 70-80 දක්වා වන තද ප්‍රහාරාත්මක සුළං) හේතුවෙන් රළු හෝ ඉතා රළු මුහුදු ප්‍රදේශ අපේක්ෂා කළ හැක.
- ඉහත පද්ධතියේ බලපෑම හේතුවෙන්, ඉදිරි දින කිහිපයේදී කන්කසන්තුරය සිට මන්නාරම, කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ වල තද වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැකි අතර සුළං වේගය ක්ෂණිකව (පැ.කි.මී. 60-70 දක්වා පමණ) ඉහළ යාමට ඉඩ ඇති හෙයින් එම මුහුදු ප්‍රදේශය ක්ෂණිකව රළු වීමට වැඩි හැකියාවක් පවතී .



TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:**

- **මැයි මස 14 වන දින සිට නැවත දැනුම් දෙන තුරු, ගිනිකොණ දිග අරාබි මුහුදු ප්‍රදේශය තුල (00-12N, 60E-75E) ධීවර සහ නාවුක කටයුතුවල නොයෙදෙන ලෙස අවවාද කරනු ලැබේ.**

- **දැනට මෙම මුහුදු ප්‍රදේශවල (00-12N, 60E-75E) ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩබිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.**

- **දිවයිනට බස්නාහිර සහ නිරිත දෙසින් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල ධීවර කටයුතුවල යෙදීමේදී, අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

- **ධීවර හා නාවුක ප්‍රජාව මේ සම්බන්දයෙන් නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ අවධානයෙන් කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**